# උදාන පාලියේ නිරූපිත තත් කාලීන සමාජ පසුබිම පිළිබඳ විමසුමක්

A study on the background of the contemporary society depicted in "Udāna Pāli"

**තිඹිරිවැව සිරිසුමන හිමි**
**එච්. ජී. එම්. කේ. විමලසිරි**

---

**Abstract**

Udāna Pāli is a scripture belonging to the khuddakanikāya of Tripitaka. It includes the saddhamma preached by the Lord Buddha. A particular book cannot be abstracted from the contemporary social background. It is well-depicted through Udāna Pāli. The book includes an abundance of data on contemporary Indian society. This research paper is written to examine the social, economic, and religious background that prevailed in India during that era, by taking Udāna Pāli as the primary source.

**Keywords:-** Economic background, Political background, Religious background, Social background, Udāna Pāli

## හැඳින්වීම

උදාන පාලිය ධර්ම ග්‍රන්ථයක් ලෙසට හඳුන්වා දුන්න ද එහි ධර්මයට අමතර ව නානාවිධ විෂය ක්ෂේත්‍ර පිළිබඳ ව සාමාජික, දේශපාලනික හා ආර්ථික තොරතුරු රාශියක් අන්තර්ගත ව ඇත. එසේ ම සමකාලීන සමාජය මැනවින් ම පිළිබිඹු වන දර්පණ තලයක් ලෙස උදාන පාලිය හඳුනාගත හැකි ය. උදාන පාලියෙන් පිළිබිඹු වන සාමාජික තතු, සුවිශේෂ චාරිත්‍ර වාරිත්‍ර, තත් කාලීන දේශපාලනික තොරතුරු, එම යුගයේ පැවතුණු ශිල්ප ශාස්ත්‍ර, අධ්‍යාපන රටාව, ආර්ථික තත්වය සංක්ෂිප්ත දක්වා තිබේ. එසේ ම බුද්ධකාලීන භාරතයේ

පැවති ආගම් දෘෂ්ටිවාද පිළිබඳ මෙන් ම ආගම්වල ස්වභාවය කෙබඳු ද යන්න අධ්‍යයනය කොට ඇත.

**පර්යේෂණ ගැටලුව**

උදාන පාලියෙන් නිරූපිත සමාජ පසුබිම කෙබඳු දැයි විමසීම.

**පර්යේෂණ ක්ෂේත්‍රය**

උදාන පාලිය

**පර්යේෂණ ක්‍රමවේදය**

පුස්තකාලයීය අධ්‍යයනයකි.

**ප්‍රවේශය**

බුද්ධභාෂිතය සූත්‍ර, විනය හා අභිධර්මය යනුවෙන් තෙවැදෑරුම් ය. එයින් සූත්‍ර පිටකය නිකාය වශයෙන් පඤ්චවිධ වේ. ඛුද්දක නිකායේ තෙවෙනි ග්‍රන්ථය උදාන පාලිය යි. එය පහත දැක්වෙන ආකාරයට වග්ග 8කින් සමන්විත වේ.

- බෝධි වග්ගය
- මුචලින්ද වග්ගය
- නන්ද වග්ගය
- මේඝිය වග්ගය
- සෝණ වග්ගය
- ජච්චන්ධ වග්ගය
- චුල්ල වග්ගය
- පාටලීගාමිය වග්ගය

එක් වර්ගයක සූත්‍ර දහය බැගින් සූත්‍ර අසූවකි. පුද්ගල සන්තානයේ ජනිත වන ප්‍රීතිය, සතුට, සොම්නස වැනි චේතනා

චිත්තාභ්‍යන්තරයේ රඳවාගත නො හැකි ව නිරායාශයෙන් මුවින් ප්‍රකාශ වන වාග්මාලාව උදාන ලෙස හඳුන්වා දීම යුක්ති යුක්ත ය (ඛුද්දකනිකාය විමංසාඃ2011ඃ52). ඛුද්දක නිකායාගත උදාන පාලියෙහි මූලික අභිලාසය උදාන ඉදිරිපත් කිරීම යි. එසේ වුවත් සමකාලීන සමාජය සමඟ සුහද ව ක්‍රියා කළ ශාස්තෘවරයෙකු නිසා බුදුරදුන්ගේ උදාන දේශනාවල සමකාලීන සමාජය මැනවින් නිරූපණය වී ඇත.

**සමාජය**

සමකාලීන භාරතීය සමාජය පිළිබඳ අධ්‍යයනයේ දී උදාන පාලියෙන් ලැබෙන ආලෝකය සුවිශාල ය. භාරතීය සමාජ ස්තරායනය වෘත්තීන් පදනම් කරගනිමින් බෙදී තිබේ. එහෙත් පශ්චාත් කාලීන බ්‍රාහ්මණ චින්තනය කුලය මූලික කරගත් බවට සාධක බහුල වේ. උදාන පාලියේ උපෝසථ සූත්‍රයේ චතුර්වර්ණය පිළිබඳ ව සඳහන් වන සටහන මේ සඳහා නිදසුන් කළ හැකි ය. ''ඒව මේව ඛෝ භික්ඛවේ චත්තාරෝ මේ වණ්ණා ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා...''(උදාන පාළිඃ2005ඃ236). සමකාලීන සමාජයේ බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශුද්‍ර යනුවෙන් කුල හතරක් පැවතිණ. මෙම චතුර් කුල අතුරින් ප්‍රබල ම කුලය ලෙස බ්‍රාහ්මණයන් වැජඹුණු අතර සමාජයේ සියලු වරප්‍රසාද හිමි වූයේ ද බ්‍රාහ්මණ කුලයට යි. චතුර්වර්ණය හැරුණු කොට අන්‍ය වූ කුල පිළිබඳ ව ද තොරතුරු ලැබෙයි. උදාන පාලියේ රථකාර යන නමින් කුලයක් පිළිබඳ සඳහන් නො වෙතත් රථකාර ශිල්පය පිළිබඳ ව සඳහන් වේ. බ්‍රාහ්මණ සමාජයේ ද නොයෙක් වර්ගීකරණ විද්‍යමාන විය. සමස්තයක් ලෙස ම බ්‍රාහ්මණ සමාජය අහංකාර මෙන් ම මානාධික පිරිසකි(උදානට්ඨකථාඃ2008ඃ31). හුහුංක බමුණාගේ ගති ලක්ෂණ උදානට්ඨ කථාවේ දක්වා ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් මෙය තහවුරු වේ. බ්‍රාහ්මණයන් සඳහා ම වෙන් කරන ලද බ්‍රාහ්මණ මහාසාල අග්‍රහාර සමකාලීන භාරත දේශයේ ප්‍රභවය වී ව්‍යාප්ත ව තිබුණු බවට උදපාන සූත්‍රය (උදාන පාළිඃ2005ඃ286) හා ඉච්ඡානංගල (උදානට්ඨකතා.ඃ2008ඃ77). යන උභය සූත්‍ර සාධක සපයයි.

සමකාලීන භාරතීය සමාජයේ ධනය සමානුපාත ක්‍රමවේදයකට බෙදී නො යෑම හා කුලය මත වෘත්ති පදනම් වීම නිසා අයුක්ති සහගත සමාජ ක්‍රමයක් ස්ථාපිත ව තිබිණ. රජවරු යස ඉසුරෙන්

සමෘද්ධ ව මහල් කීපයකින් යුක්ත මන්දිර සඳළුතලවල නිවාස ග්‍රහණය කළහ (උදාන පාළිඃ2005ඃ220). සිටුවරු හෙවත් වෛශ්‍යයෝ සමෘද්ධිමත් ජීවන වෘත්තියක් ගත කළහ (උදානට්ඨකථාඃ2008ඃ47). රටේ ආධිපත්‍ය රජු හෙබ වුවත් රාෂ්ට්‍රවාසි ප්‍රභූන්ට පෞද්ගලික ව ම උද්‍යාන අයත් ව තිබූ බව පෙන්වා දිය හැකි ය (උදාන පාළිඃ2005ඃ294). තමාගේ ධනවත්භාවය මෙන් ම නිර්ධනභාවය කුලය හා වෘත්තීය මත ම පදනම් ව තිබූ බවට එළවිය හැකි සාධක රාශියකි. සිය ජීවන ප්‍රවෘත්තිය සඳහා ම පේශ කර්මාන්තය ආදි රැකී රක්ෂාවල නියුක්ත වූ පිරිසක් සමකාලීන සමාජයේ ජීවත් වූහ. මේ ඒ සඳහා නිදර්ශනයකි. ''පේසාකාරවණ්ණං අභිනිම්මිත්වා තත්තං විනාති සුජා අසුරකඤ්ඤා තසරං පූරෙති'' (එම,186).

සමාජ පන්තිය, ධනවත් බව ආදි නිර්ණායක මූලික කරගනිමින් ඒ ඒ කුල ගෝත්‍ර අයත් වෘත්ති වෙන් කරන ලද බවට මෙම උපුටනය ප්‍රමාණවත් සාධකයකි. "...යෙන දළිද්දා විසිඛා කපණ විසිඛා පේසකර විසිඛා..."(එම,136).

දුප්පතුන් මෙන් ම පේශකරුවන් සඳහා නගරයේ වෙන ම වීථි වෙන් කරවා තිබිණ. මෙය ජනතාවගේ වස්ත්‍ර අවශ්‍යතාව සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය සේවය ඉතා පහසුවෙන් ම ලබා ගැනීම සඳහා සිදු කරන ලද්දක් විය යුතු ය. බ්‍රාහ්මණ සමාජය විසින් ජනතාව කුල ගෝත්‍ර වශයෙන් වෙන් කොට තැබීමෙන් ස්වකීය ආධිපත්‍ය තහවුරු කරගැනීම සඳහා උත්සාහ කරන ලදි. සමකාලීන සමාජය කාලගුණය පිළිබඳ ව සබුද්ධික වූ බවට තොරතුරු උදාන පාලියේ පිළිබිඹු වේ(එම,140). හිම සෘතුවේ හිම වැටීම පිළිබඳ ව ඔවුහු ඉතා මැනවින් කරුණු කාරණා දත්හ. ලොව ඉපැරණි ම වෘත්තියක් වන ගණිකා වෘත්තිය බුද්ධකාලීන භාරතීය සමාජයේ ද ස්ථාපිත ව තිබිණ. ගණිකාවන්ගේ සේවාව ලබා ගැනීම සඳහා පැමිණියවුන් අතර නොයෙක් කල කෝලාහල සිදු වූ අයුරු ගණිකා සූත්‍රයෙන් පැනෙයි(එම,272.) බෝසතාණන් වහන්සේ සයාවුරුද්දක් දුෂ්කර ක්‍රියා කොට බුද්ධත්වයට පත් ව දහම් දෙසීම සමඟ ම බොහෝ පිරිසක් බුදු දහම වැළඳ ගත්හ. එසේ පැවිදි වූවෝ සත්‍ය ගවේෂක තරුණයෝ වූහ. විවාහක තරුණයන් අඹුදරුවන් අතහැර දමා ප්‍රවෘජ්‍යා භූමියට සම්ප්‍රාප්ත වීමත් සමඟ ම අඹුවන් නිරාධාර වූ බව පෙනේ. සිය ස්වාමියා දරුවා සහ තමන් අතහැර

දැමීම නිසා සංගාමජී තෙරුන්ගේ පුරාණ දුතිකාව සහ බිළිඳු දරුවා අසරණ ව ඛේදයට පත් වූ ආකාරය සංගාමජී සූත්‍රයෙන් විවරණය වේ. ස්වාමියා සසුන්ගත වීම නිසා ඔහුගෙන් යැපුණු පිරිස අසරණ බවට පත් වූ ආකාරයත් ඉතා මැනවින් නිරූපණය වේ(එම,138). දාරක ප්‍රසූතිය පහසු කිරීම සඳහා හෝ දාරක ප්‍රසූතියෙන් පසු ව ගර්භිණී කාන්තාවන්ට තල තෙල් ප්‍රයෝජනවත් වූ ආකාරය ගර්භිණී සූත්‍රයේ දක්නට ලැබෙයි. එසේ ම විරේක කිරීමේ ක්‍රමවේදයක් පැවති බවට විශ්වාස කළ හැකි සාධක හමු වේ(එම,156). උදාන පාලියෙන් පිළිබිඹු වන සමාජය අතිධාවනකාරි සංකීර්ණ සමාජයක ලක්ෂණ පෙන්නුම් නො කරයි. ඔවුහු තම අවශ්‍යතා ඉටු කොට ගෙන සාමාන්‍ය ජීවිතයක් ගත කළහ. එම සමාජයේ ජීවත් වූවෝ සමාජය පිළිබඳ ව මෙන් ම තමන් ජීවත් වන්නා වූ පරිසර හා පාරිසරික පද්ධතියට අයත් වන සාමුද්‍රික ජලජ ජීවීන් පිළිබඳ ව සවිඥානික වූහ. සාමුද්‍රික ජීවීන් වන තිමි, තිමිංගල, තිමිර පිංගල, යන විශාල මත්ස්‍යයන් පිළිබඳ ව මෙන් ම අසුර, නාග, ගන්ධර්ව ආදීන් පිළිබඳ ව ද පුළුල් අවබෝධයක් සමාජය සතු වූ බවට සාධක තිබේ(එම,234). භාරතවර්ෂය ජලයෙන් ස්වයංපෝෂණ කරන ලද ගංගා, යමුනා, අචිරවති, සරභූ, මහී යන පඤ්ච මහා ගංගා පිළිබඳ ව සාමාන්‍ය ජනයා පවා දත්හ (එම,232). මූලික අවශ්‍යතා සාධනයේ දී එම ගංගා ජන ජීවිතය සමග ඒකාබද්ධ ව පැවතිණ.

ජනයා අලංකරණය සඳහා භාවිත කරන නානාවිධ රත්නයන්ට ප්‍රියවීම සහජ ස්වභාවයකි. ඔවුහු මුතු, මැණික්, වෙරළුමිණි, සක්, සිලා, පබළු, රිදී, රත් මැඩිරිගල් ඉතා හොඳින් දැනගෙන සිටියහ. මෙම රත්න ආශ්‍රය කරගනිමින් නොයෙක් ආභරණ ඔවුන් නිපදවන ලද බවට කිසිඳු සැකයක් නැත (එම). ගංගාතරණය කිරීම සඳහා වැසියෝ නැව, උඩුපය, පසුර යොදා ගත්හ. පෙර සඳහන් කළ ආකාරයට මහා සමුද්‍රවාසී මත්ස්‍යයන් පිළිබඳ ව සවිඥානික වීම නිසා ඔවුන් සමුද්‍ර තරණයේ ද නියුක්ත වූ පිරිසක් බව නිගමනය කිරීම සාධාරණ ය (එම,310). අවුරුද්දක් යන කාල පරාසය වෙන් කොට හඳුනා ගැනීමට භාරතීය සමාජය සමත් වූ අතර ම සතිය හා සතියට අයත් දින සංඛ්‍යාව පිළිබඳ ව ද ඔවුහු සබුද්ධික වූහ (එම,159). එවක සමාජයේ මිනිසුන් අතර අඬදබර ගැටුම් ඇති වූ විට දී ඔවුන් ක්‍රියා කළ ආකාරය හා වර්තමාන සමාජයේ මිනිසුන් ක්‍රියාත්මක වන ආකාරය අතර වෙනසක් දක්නට නො ලැබේ. එය මෙසේ පෙන්වා දිය හැකි ය.

''භණ්ඩනජාතා කලහාජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං පාණිම්හි උපක්කමන්ති ලෙඩ්ඩුහිපි උපක්කමන්ති දණ්ඩෙහිපි උපක්කමන්ති සත්ථේහිපි උපක්කමන්ති තේ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තතම්පි දුක්ඛං'' (එම,272).

භාරතිය සමාජයේ කුල වාදය ඉතා ප්‍රබල ලෙස ස්ථාපිත කොට තිබූ නිසා හීන යැයි සම්මත වූවන් වසලයන් ලෙස ව්‍යවහාර කොට තිබේ. තව කෙනෙකුට නින්දා හා අපහාස කිරීමේ දී වසල ව්‍යවහාරයෙන් ආමන්ත්‍රණය කිරීම ඔවුන්ට සිදු කරන උපරිම නිග්‍රහය ලෙස මෙහි තොරතුරු ඇතුළත් ය. සමාජය කාලානුරූප ව මිනිසුන් හැඳින්වීම සඳහා නොයෙක් ක්‍රමවේද භාවිත කරනු ලබයි. ඇතැම් කාලවල දී පියාගේ නාම ගෝත්‍රාදියට ප්‍රමුඛස්ථානයක් ලබාදුන් භාරතීයන් බුද්ධ කාලයේ දී මවගේ ගෝත්‍රයට මූලික තැනක් ලබා දෙමින් තමන් හඳුන්වා දීමට උත්සුක වූ ආකාරය විද්‍යමාන වේ. ''තේන ඛෝ පන සමයේ ආයස්මා භද්දියෝ කාලි ගොධාය පුත්තෝ'' (එම,166). ඉහත දක්වන ලද උදාහරණයෙන් එය තහවුරු වේ.

## චාරිත්‍ර වාරිත්‍ර

ඕනෑම සාහිත්‍යය නිර්මාණයක සමකාලීන සමාජය නිරූපණය වීම වැළැක්විය නො හැකි ය. උදාන පාලිය ආශ්‍රයෙන් භාරතීය සමාජයේ එවකට පැවති තොරතුරුවලින් සමහරක් දත හැකි ය. කෙනෙකු මිය පරලොව ගිය පසු ව ඔහුට හෝ ඇයට ඥාතීත්වය දක්වන සියලු ම දෙනා මිය ගිය පුද්ගලයාගේ දේහය දැවීම හෝ භූමදාන කිරීම සිදු කොට තෙත් වූ වස්ත්‍ර හා ශරීරවලින් කේශ කලාපයෙන් යුක්ත ව දහවල් කාලයේ දී දවස ගත කරන ලද බවට තොරතුරු විසාඛ සූත්‍රය හා ඒක පුත්‍ර සූත්‍රයෙන් අවධාරණය කොට ඇත්තේ මේ ආකාරයෙනි. ''නත්තා මේ භන්තම් පියමනාපා කාලකතා තේනාහං අල්ලවත්ථා අල්ලකේසා ඉධූපසංකතා දිවා දිවසං'' (එම,312). ''මය්හං ඛෝ භන්තෙ ඒක පුත්තෝසි පියෝ මනාපෝ කාලකතෝ තේන මයං අල්ලවත්ථා අල්ලකෙසා ඉධූපසඞ්කන්තා දිවා දිවස්සාති'' (එම,156). ගෞරව සම්භාවනා වන්දන මානනාදිය කළ යුතු ශ්‍රේෂ්ඨයෙකු අභිමුඛයට ප්‍රවේශ වන විට දී පඤ්ච දෝෂ විරහිත වන ආකාරයට එම ශ්‍රේෂ්ඨයා ඉදිරියට ගොස් එකත් පසෙක වී සිටීම මෙම සමාජයේ සුවිශේෂි ලක්ෂණයකි (එම,166). බුදුරජාණන් වහන්සේට සිදු

කරන ලද ආරාධනා උන් වහන්සේ බොහෝ දුරට භාරගන්නා ලද්දේ තුෂ්ණිම්භූත ව ය (එම,202).බුද්ධාදි ශ්‍රේෂ්ඨ වූ උත්තමයන් අභිමුඛයේ දී ඇතැමෙකු භූමිය මත ම හිඳගත් අතර සමාජයේ උසස් යැයි සම්මත ඇතැම් ප්‍රභූවරයෙකු තරමක් මිටි වූ ආසනයක් භාවිත කරන ලද ආකාරය ගෝපාල සූත්‍රයෙන් ගම්‍ය වේ.

"අථ ඛෝ සෝ ගෝපාලකෝ භගවන්තං භුත්තාවිං ඕනීත පත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා ඒකමන්තං නිසීදි" (එම, 204). කිසිඳු විටෙක ශ්‍රේෂ්ඨ පුද්ගලයාට වඩා උස් ආසනයක හෝ ශ්‍රේෂ්ඨ පුද්ගලයා සමඟ සම ආසනයක නො හිදි අතර පහත් වූ ආසනයක ම පමණක් හිඳගත් බවට තොරතුරු ත්‍රිපිටකයේ ද සුලභ වේ. මිය ගිය පසු ව ඇතමෙකු මෘත දේහය තැම්පත් කිරීම සඳහා නොයෙක් ආකාරයේ මඤ්ජුසා නිර්මාණය කළ ද ඇතැම් කෙනෙකු ඇඳක් මත තබා ගෙන ආදාහන කිරීම සඳහා රැගෙන ගිය ආකාරය සුන්දරී සූත්‍රයෙන් දත හැකි ය (එම,212). බුද්ධ කාලීන ව ම ක්ෂීණාශ්‍රවයන් වහන්සේ නමක පිරිනිවන් පෑ පසු උන් වහන්සේගේ ආදාහන කෘත්‍ය සිදු කළ ආකාරය පිළිබඳ වටිනා සඳහනක් මෙහි අන්තර්ගත වේ. ස්තූපකරණයේ ප්‍රාරම්භක ම අවස්ථාවක් පිළිබඳ ව සඳහන් වන්නේ මෙ ලෙසිනි. ''ගණ්හථ භික්ඛවේ බාහියස්ස දාරුචීරිය යස්ස සරීරකං මඤ්චකං ආරෝපෙත්‍වා නීහරිත්‍වා ඣාපේථ ථූප ථූපකචස්ස කාරෝපේථ'' (එම,146). යම්කිසි ගෘහයකට මඟ ගෙවා පාද යාත්‍රාවෙන් පැමිණි අයෙකු වේ නම් පාද ධෝවනය කරගෙන එම ගෘහයට හෝ මන්දිරයට ප්‍රවේශ වූ බවට පාටලී සූත්‍රය හා සෝණ සූත්‍රය සාක්ෂ්‍ය සපයයි. මෙහි පෙන්වා දෙන ආකාරයට අනභිමුඛ වන්දනය සඳහා දූතයන් යොදා ගෙන තිබේ (එම,160).

**දේශපාලනය**

මෙවක සමාජයේ පැවති දේශපාලනික තතු සොයන්නෙකුට උදාන පාලියෙන් මහඟු පිටිවහලක් ලැබෙයි. රටේ ඉදිරි පැවැත්ම හා සංවර්ධනය කෙරෙහි දේශපාලනික ස්ථාවරය සෘජු ව ම බලපායි. ඒ සඳහා ආරක්ෂක ඔත්තු සේවා ක්‍රියාත්මක විය. වැඩුණු කෙස් නිය ඇති ප්‍රව්‍රජිත පරිෂ්කාරධාරී ජටිල, අචේලක, පරිබ්‍රාජක, ඒකසාටක, නිගණ්ඨ ආදි ආගමික වේශධාරී ආරක්ෂකයන් සම්පූර්ණ රාජධානියේ ම යෝග්‍ය

ලෙස ස්ථානගත කොට තිබිණ. රජු යම් ප්‍රදේශයක සඤ්චාරය කිරීමට බලාපොරොත්තු වන්නේ නම් ඊට පෙර එම ප්‍රදේශයට චරපුරුෂයන් යවා තොරතුරු නිවැරැදි ව ම ග්‍රහණය කිරීමකින් තොර ව රජු සංචාරය නො කළ බව පෙනේ. රටක ආරක්‍ෂාව තහවුරු කරනු වස් චරපුරුෂ සේවාව ඉතා සූක්‍ෂම ලෙස යෙදීමට තරම් බුද්ධ කාලීන රාජ තන්ත්‍රය සමත් වූ බව තහවුරු වේ.

සෑම රාජ්‍ය පාලකයෙක් ම පාහේ සිය රාජධානිය විශාල කරගැනීම සඳහා රුචියක් දක්වයි. තම රාජ්‍ය සුවිශාල වූ පමණට ම එම රාජ්‍යයට මෙන් ම රජුට ද ලැබෙන කීර්තිය දේශපාලනික වශයෙන් වැදගත් වෙයි. පාටලීපුත්‍ර ගම නගරයක් ලෙසට සකලාංග යෙන් සමලංකෘත කොට සිය රාජධානියට ඒකාබද්ධ කොටගෙන තම රාජ්‍ය තවත් ශක්තිමත් කරගනු රිසි වූ අජාසත් රජතුමා සුනීධ හා වස්සකාර උභය මහාමාත්‍යවරුන් පාටලීපුත්‍ර නගරය ඉදිකිරීම ආරම්භ කරන ලද්දේ බුදුරදුන් ධර්මාන කාලයේ දී ම ය (එම, 306). රටවැසියාට අත්‍යවශ්‍ය සේවා හා පහසුකම් සැලසීම රජකෙනෙකුට අයත් ප්‍රබල ම වගකීමකි. ශ්‍රමණ බ්‍රාහ්මණක පණ්ද්ධිකව නිබ්බකයාචකාදීන් විෂයෙහි දාන ශාලා ඉදිකර තිබිණ. එ ලෙස රටේ වැසියන්ට අවශ්‍ය තාක් පරිභෝජනය කිරිම සඳහා තල තෙල් පරිත්‍යාග කළා වූ ස්ථානයක් කොෂ්ඨාගාරයේ ස්ථාපිත කළ බව සඳහන් වේ(එම,154). මෙයින් පෙනී යන්නේ රජතුමා රටේ ජනයාගේ අවශ්‍යතා පිළිබඳ ව අවබෝධයෙන් පසු වූ බව යි. අන්තර් රාජ්‍ය අරගල සිදු වූ බවට සාධක උදාන පාලියෙන් හමු වේ (එම,302). කොසොල් රජතුමා හා බිම්බිසාර රජතුමා අතර යම්කිසි රාජ්‍යය ගැටුමක් වූ බවට සාධක ලැබේ. රජෙකුගේ බලය හා ඓශ්චර්ය එම රජුගේ ප්‍රෞඪත්වය පිළිබිඹු කරන දර්පණය ලෙසට සමකාලීන සමාජය විශ්වාස කළ ආකාරය රාජ සූත්‍රයේ දැක්වෙන පහත උද්ධෘතයෙන් ප්‍රත්‍යක්‍ෂ වේ. ''කෝ නු බෝ ආවුසෝ ඉමේසං ද්වින්නං රාජූනං මහද්ධනතරෝ වා මහාභෝගතරෝ වා මහා කෝසතරෝ වා මහා විජිතතරෝවා මහා වාහනතරෝ වා මහා බලතරෝ වා මහිද්ධිකතරෝ වා මහානුභාවතරෝ වා රාජා වා මගධෝ සේනියෝ බිම්බිසාරෝ රාජා වා පසේනදි කොසොලෝති'' (එම,149). භික්‍ෂූන් වහන්සේ අතර පවා රජවරුන් දෙදෙනාගේ බලපරාක්‍රමය පිළිබඳ සිදු වූ සාකච්ඡාවෙන් කොසොල් රජ හා බිම්බිසාර රජතුමා අතර යම්කිසි අරගලයක් තිබුණු බව වඩාත් තහවුරු වෙයි. එම රජවරුන් සතු ව අන්තඃපුර තිබූ බවට සාධක හමු වේ (එම,168).

## ශිල්ප ශාස්ත්‍ර

උදාන පාලියේ ශිල්ප ශාස්ත්‍ර හා අධ්‍යාපනය පිළිබඳ සුපැහැදිලි විස්තරයක් ''සිප්ප'' සූත්‍රයේ දක්නට ලැබෙයි. සමාජයේ ජනප්‍රිය ව පැවති ශිල්ප ශාස්ත්‍ර 12ක් පිළිබඳ ව සඳහන් වේ. ඒවා නම්, හස්ති ශිල්පය, අශ්ව ශිල්පය, රථ ශිල්පය, ධනු ශිල්පය, ආයුධ ශිල්පය, මුද්‍රා ශිල්පය, ගණනා ශිල්පය, සංඛ්‍යා ශිල්පය, ලේඛන ශිල්පය, කාව්‍ය ශිල්පය, ලෝකායත ශිල්පය, ක්‍ෂත්‍ර ශිල්පය (එම,154). ඉහත දක්වන ලද ශිල්ප ශාස්ත්‍ර කෙබඳු ඒවාදැයි ''සිප්ප'' සූත්‍රයේ පැහැදිලි කර නැතත් පරමත්ථදීපනී නම් උදාන පාලි අට්ඨකථාවේ ඒවා ඉතා සවිස්තර ව දක්වා තිබේ (උදානට්ඨකථා:2008:164).

## ආර්ථිකය

ශිලා යුගය දඩයම් යුගය පසුකරගෙන පැමිණි මානවයා ස්ථිර වාසස්ථාන සකස් කරගනිමින් කෘෂිකාර්මික යුගයට ප්‍රවේශ වීම උදාන පාලි සමාජයේ සුවිශේෂී ලක්‍ෂණයකි. කෘෂිකාර්මික රටාවේ දී සත්ව පාලනය යම් ප්‍රමාණයකට අත්‍යවශ්‍ය සාධකයක් වූ බව පෙනෙයි. කෘෂි ආර්ථිකයේ දී ප්‍රධාන ආදායම වූයේ වී ගොවිතැන යි. සත්ව පාලනයේ දී භාරතවාසීන් ගව පාලනය කෙරෙහි විශේෂ වූ අවධානයක් යොමු කොට තිබිණ. ගව පාලනයෙන් විශාල ම ආදායමක් උපයන ලද්දේ පස් ගෝ රසවලිනි. (එම199-.201). ගව පාලනය නිසා ධනයෙන් ආඪ්‍ය වූ උසස් ජීවිත ගත කරන ලද ජනයා පිළිබඳ ව උදාන පාලියේ සඳහන් වේ. කෘෂි ආර්ථිකයේ වී ගොවිතැනට ඉහළ තැනක් ලැබුණු නිසා ම බ්‍රාහ්මණ කුලය නියෝජනය කරන ලද පිරිස පවා වී වගා කිරීමේ නිරත වූ බවට සාධක ලැබේ(එම,329-332). මෙම සමාජයේ ගංගා නිම්න ආශ්‍රිත ව ප්‍රධාන නගර කේන්ද්‍රගත කරන ලද්දේ ජල අවශ්‍යතාව සම්පූර්ණ කරගනු පිණිස ය. එසේ ගංගා ආශ්‍රිත ව ජීවත් වූ පිරිස කෘෂි කර්මාන්තයට අමතර ව මත්ස්‍ය කර්මාන්තය සිදු කළ බව පෙනී යයි. මත්ස්‍ය විලෝපනස්ථාන මෙන් ම මසුන් මැරීම පිළිබඳ ව ද සඳහන් වන්නේ මෙ ලෙසිනි. ''කෙවට්ටා මඤ්ඤේ මච්ඡවිලෝපේ'' (උදාන පාළි:2005:176).

**ආගම**

ප්‍රාග් බෞද්ධ භාරතීය ආගමික සමාජය නානා විධ ආගමික දෘෂ්ටිවාදවලින් ගහණ ව පැවතිණ. නොයෙක් ආගමික කණ්ඩායම් පුහුදුන් මිනිසුන්ගේ ලාභ සත්කාර ලබමින් දෘෂ්ටිවාද ව්‍යාප්ත කළහ. බුදු දහමේ ප්‍රභවය හා ව්‍යාප්තිය සමඟ ම ඔවුහු ලාභසත්කාරයෙන් ගිලිහුණහ. එයින් ප්‍රකෝපිත වූ ආගමික කණ්ඩායම් බුදුරදුන්ට ධර්මයට මෙන් ම සංඝරත්නයට ද නිග්‍රහ කිරීම සඳහා නොයෙක් අධම ක්‍රියාවල නිමග්න වූ ආකාරය දක්නට ලැබේ. වරක් බ්‍රාහ්මණ මහාසාල ග්‍රාමයකට බුදුරදුන් ප්‍රවේශ වන බව පූර්වයෙන් ම දත් බමුණන් නියං සමයේ දිය තිබූ එක ම ළිඳ වසා දමනුයේ බුදුරදුන් අපහසුතාවට පත් කරනු සඳහා ය(එම,286). තවත් වරෙක සුන්දරී පරිබ්‍රාජිකාව ඝාතනය කොට විහාර භූමියේ වළදමා බුදුරදුන්ට නිග්‍රහ කළහ(එම,212). තමන් සතු ව තිබූ ලාභ සත්කාර හා ශ්‍රාවක පිරිස තමාගෙන් ගිලිහී යෑම නිසා ම ද්වේශ සහගත ආකාරයෙන් බුදුරදුන්ට ''මුණ්ඩක'', ශ්‍රමණක, යනාදී වශයෙන් නිග්‍රහ කරන ලද ආකාරය පහත උද්ධෘතවලින් තහවුරු වේ.''පස්සථයයා සමණානං සක්‍යපුත්තියානං කම්මං අලජ්ජනෝ ඉමේ සමණා සක්‍යපුත්තියා දුස්සීලා පාපධම්මා මුසාවාදිනෝ අබ්‍රහ්මචාරිනෝ''(එම,213).

සමකාලීන බ්‍රාහ්මණ සමාජය බුදුරදුන් කෙරෙහි බද්ධ වෛරයකින් පසු වූ බව ඉහත උදාහරණවලින් පැහැදිලි වේ. සමකාලීන සමාජයේ දෘෂ්ටිවාද ඉතා දරුණු ලෙස ව්‍යාප්ත වීම නිසා ඇතැමෙකුගේ මනෝභාව විකෘති වීම කරණකොටගෙන වඤ්චනික ධර්මතාවන් පහළ වීම නිසා තමන් රහත් වී ඇතැයි යන මතය ඇති වූ ආකාරය දක්නට ලැබෙයි(එම,142). භික්ෂු සංස්ථාව ආගමික සංස්ථාවලින් ආභ්‍යන්තරික හා බාහිර වශයෙන් වෙනස් වූ බව පෙනෙයි. දිවි ඇති තාක් එක් වේලක් පමණක් ම වැළඳීම, හුදෙකලාව සයනය කිරීම, බඹසර හැසිරීම, භික්‍ෂු සංස්ථාවට ම අනන්‍ය වූ ලක්ෂණ යි(එම,242). ප්‍රව්‍රජ්‍යා භූමියට පත්වන පුද්ගලයා කෙහෙ රැවුල් කපා කසාවත් හැඳගැනීම බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායේ අනිවාර්ය ලක්ෂණයකි (එම). භික්ෂූන් චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍ය යන සිවුපසයෙන් සිය ජීවිකාව පවත්වාගෙන ගිය බව පෙනෙයි. පාත්‍රය, ජලය පරිහරණය හා දන් වැළඳීම යන උභය කාර්ය සඳහා යොදා ගැනිණ(එම,298). සමකාලීන භික්ෂු සමාජයේ ස්වභාවය බාහිය සූත්‍රයේ දී මැනවින්

ම නිරූපණය කොට තිබේ(එම,143). භික්ෂූහු ආරාමවල මෙන් ම පර්වතවල ද වාසය කළහ(එම,194). බුද්ධ කාලීන භික්ෂු සමාජයේ ස්වභාවය පිළිබිඹු කරන මූලාශ්‍රය අතර උදාන පාලියට ප්‍රධාන තැනක් ලැබෙයි.

සමකාලීන සමාජය විසින් ආගමික පුද පූජා සිදු කරන ලද ස්ථාන කිහිපයක් මෙහි සඳහන් වේ. උදේන චේතිය, ගෝතමක චේතිය, සත්තම්භක චේතිය, බහුපුත්තක චේතිය, යනු උක්ත ආගමික ස්ථානයෝ ය. මෙම ස්ථානවල සෞන්දර්යාත්මක වටිනාකමක් තිබූ බව පෙනී යයි(එම,250). උදපාන සූත්‍රාගත ථූන ග්‍රාමය හුදෙක් බ්‍රාහ්මණ මහාසාල ග්‍රාමයක් වූ බව පෙන්වා දිය හැකි ය. බ්‍රාහ්මණ ග්‍රාමයක යාගහෝම සිදු කිරීම නිතර ම සිදු වේ. එහි සතුන් යාගස්ථම්භය මත තබා දෙවියන් වෙනුවෙන් දිවි තොර කිරීම සිදු වේ. මේ යාගස්ථම්භය මූලික කරගනිමින් ථූන යන නාමය ගමට භාවිත කරන ලදි. ක්ෂීණාශ්‍රව ශ්‍රාවකයන් පිරිනිවන් පෑ කල්හි උන් වහන්සේලාගේ ධාතු තැන්පත් කරමින් ස්මාරක ඉදිකරන කොට තිබේ. උදාන පාලියේ ''අජකලාපක චේතිය'' නම් ස්ථානයක් පිළිබඳ ව සඳහන් වේ. පරමත්ථදීපනී උදාන පාලි අට්ඨකතාව එම ස්ථානය යක්ෂයන් සඳහා නිර්මාණය කරන ලද දෙවොලක් වූ බව පෙන්වා දෙයි(උදානට්ඨ කතා : 2008:83). කුණ්ඩධාන යක්ෂයා සඳහා සහල් කුඩු මිශ්‍ර රොටි පුද පූජා කළ බව පෙනේ(එම,50). සමකාලීන භාරතීය ආගමික කණ්ඩායම් පව් සේදීම සඳහා සිදු කරන ලද උදක පාරිශුද්ධිය හා අග්නි හෝම යන යාග ක්‍රම පිළිබඳ ව උදාන පාලියේ මැනවින් විවරණය වේ. තමන් කරන ලද පව්වලින් මිදීම සඳහා සමහර ජටිලයන් දියේ ගිලෙමින් ද ඇතැමෙක් එක් වරක් පමණක් දියේ ගිලෙමින් ද ඇතැමෙක් සම්පූර්ණ ශරීරය දියේ ගිල්වමින් උදක පාරිශුද්ධිය සිදු කළහ. හිස මුඩුකරගත් ඇතැමෙක් දියට නො බසිමින් ගංගාතීරයේ සිට හිසට දිය ඉසගනිමින් උදක පාරිශුද්ධිය සිදු කළහ. ඇතැමෙක් යාග සමයේ ගිනි දල්වමින් ගිනි දෙවියන් පිදූහ(එම,51). භාරතීය සමාජයේ පැවති ආගම් හා දාර්ශනික දෘෂ්ටිවාද පිළිබඳ ව සඳහන් ව ඇති උදානපාලි ජච්චන්ධ වග්ගයට ලැබෙන්නේ සුවිශේෂි ස්ථානයකි. තමන් දරන මතය ම පමණක් සත්‍ය ලෙස දැකීම හා අන්‍ය මතයන් සියල්ල ම අසත්‍ය ලෙස දැකිම නිසා දෘෂ්ටි මතවාද ගැටීම සිදු වේ. දෘෂ්ටිවාද ගැටීම නිසා සමකාලීන සාමාජික හා ආගමික වශයෙන් නොසන්සුන්කාරි තත්වයක් හටගෙන

මිනිසුන් පීඩාවට පත් වූ ආකාරය උදාන පාලියේ ජච්චන්ධ වග්ගයෙන් විශද වේ. ප්‍රථම, ද්විතීය හා තෘතීය නානාතීර්ථක සූත්‍රයෙන් දෘෂ්ටිවාද රාශියක් ඉදිරිපත් කෙරෙයි. ඒවා මෙලෙස සංග්‍රහ කළ හැකි ය.

I. ලොව ශාස්වත ය.

II. ලොව අශාස්වත ය.

III. ලොව අන්තවත් ය.

IV. ලොව අනන්තවත් ය.

V. ආත්මය ද ලෝකය ද ශාස්වතය.

VI. ආත්මය ද ලෝකය ද අශාස්වතය.

VII. ආත්මයත් ලෝකයත් ශාස්වතත් නො වේ අශාස්වතත් නො වේ.

VIII. ආත්මයත් ලොකයත් ශාස්වතත් අශාස්වතත් නො වේ.

IX. ආත්මය මරණින් මතු ඇත.

X. ආත්මය මරණින් මතු නැත.

XI. ආත්මය මරණින් මතු ඇත්තෙත් වෙ යි නැත්තෙත් වෙ යි.

XII. ආත්මය මරණින් මතු ඇත්තෙත් නො වේ නැත්තෙත් නො වේ.

XIII. ලෝකයත් ආත්මයත් ස්වයංකෘත ය.

XIV. ලෝකයත් ආත්මයත් පරංකෘත ය.

XV. ලෝකයත් ආත්මයත් ස්වයංකෘතය පරංකෘත ය.

XVI. ලෝකයත් ආත්මයත් අස්වයංකෘතය අපරංකෘත ය.

XVII. ජීවයත් ශරීරයත් දෙකකි.

XVIII. ජීවයත් ශරීරයත් එකකි.

XIX. සුවදුක් ආත්මය ලෝකය මේ හැම ශාස්වත ය.

XX. සුවදුක් ආත්මය ලෝකය මේ හැම අශාස්වත ය.

XXI. සුවදුක් ආත්මය මේ හැම ශාස්වත ද අශාස්වත ද වේ.

XXII. සුවදුක් ආත්මය ලෝකය මේ හැම ශාස්වත ද අශාස්වත ද නො වේ.

XXIII. සුවදුක් ආත්මය ද ලෝකය ද ස්වයංකෘත වේ.

XXIV. සුවදුක් ආත්මය ද ලෝකය ද පරංකෘත වේ.

XXV. සුවදුක් ආත්මය ද ලෝකය ද ස්වයංකෘත යි පරංකෘත යි.

XXVI. සුවදුක් ආත්මය ද ලෝකය ද අසංකෘත අපරංකෘත ය (උදාන පාළිඃ 2005ඃ258-269).

භාරත වර්ෂයේ බුද්ධකාලීන ව පැවති දෙසැටක් වූ මිථ්‍යාදෘෂ්ටින් අතුරින් සූවිස්සක් උදාන පාලියේ දක්වා තිබේ. මෙම දෘෂ්ටි වාදවලින් බහුතරය ඉදිරිපත් කොට ඇත්තේ චතුෂ්කොටික තර්කන ක්‍රමයට අනුව ය. යම්කිසි දෘෂ්ටිවාදයක් ප්‍රභවය වීම සඳහා මූලික ව ම බලපාන කාරණා ලෙස ලෝකය, ආත්මය, සුවදුක්, ශරීරය, ජීවය ආදිය ප්‍රමුඛ වේ. ලෝකය ආත්මය ආදි කාරණා සයංකෘත පරංකෘත ආදි වශයෙන් විවරණය කිරිම නිසා ගැටලුකාරි තත්වයක් මතු ව තිබේ. සමකාලීන ව ඉන්දියාවේ ප්‍රසිද්ධ ව පැවතුණු ජටිල, පරිබ්බාජක, අචේලක හා නිගණ්ඨ ආදී ආගමික කණ්ඩායම් කිහිපයක් පිළිබඳ ව සඳහන් වේ(59.එම,256).

## සමාලෝචනය

ඛුද්දක නිකායට අයත් කෘතියකි උදාන පාලිය. උදාන පාලියේ ධර්ම කාරණා මෙන් ම සමකාලීන තොරතුරු රාශියක් ද අන්තර්ගත වේ. සමකාලීන සමාජයේ වර්ණභේදයේ ස්වභාවය මිනිසුන් ජීවන ප්‍රවෘත්ති පවත්වාගෙන ගිය ආකාරය පිළිබඳ ව සඳහන් වේ. සාමාන්‍ය මිනිස් ජීවිතවල ඇතුළත් ව ඇති චාරිත්‍ර වාරිත්‍ර රාශියක් පිළිබඳ ව තොරතුරු මෙහි ඇතුළත් වේ. කෙනෙකු මිය ගිය පසුව සිදු කරන ලද අමුතු ම චාරිත්‍රයක් වන දියෙන් තෙත් ව දවල් කාලය ගත කිරීම සුවිශේෂ වූ චාරිත්‍රයකි. ගරු කළයුතු අයෙකු ඉදිරියේ එකත් පසෙක අසුන් ගැනීම ආදිය ඉතා වැදගත් චාරිත්‍ර ලෙසට හඳුනාගත හැකි ය. දේශපාලනික වශයෙන් රටේ ආරක්ෂාව පිළිබඳ රජු ආරක්ෂක විධිවිධාන සලසා තිබූ ආකාරය ඉතා විශේෂිත ය. රාජ්‍ය විශාල කරගැනීමට රජවරුන් ක්‍රියාකළ ආකාරය මෙන් ම රජවරුන් අතර පැවති යම් යම් ගැටුම් පිළිබඳ ව ද මෙහි තොතුරු දක්වෙයි. සමකාලීන සමාජයේ ජනතාව ශිල්පීය ඥානයෙන් පරිපූර්ණ පිරිසක් බව උදාන පාලියේ සඳහන් වන්නා වූ ශිල්ප ශාස්ත්‍ර දොළහෙන් දත හැකි ය. කෘෂිකර්මාන්තය හා සත්ව පාලනය මූලික කරගනමින් රටේ ආර්ථිකය ගොඩනැගී තිබූ බව පෙනේ. ප්‍රාග් බෞද්ධ යුගයේ සිට ම භාරතීය ජනතාව නොයෙක් ආගමික මත දෘෂ්ටිවාද බවට පත් කරගනිමින් අන්‍යෝන්‍ය වශයෙන් ගැටුම් ඇතිකරගත් ආකාරය මෙහි ඉතා මැනවින් විවරණය කොට ඇත. බුදු දහම සම්ප්‍රාප්ත වීමත් සමඟ ම එවකට ආගමික ක්ෂේත්‍රයේ වැජඹුණු අනෙක් ආගම්වලට ලැබුණු ලාභ සත්කාර ගිලිහී යෑම නිසා ම අන්‍ය ආගමිකයන් බුදුරදු හා උන් වහන්සේගේ ශ්‍රාවකයන් සමඟ ද්වේශ සහගත ලෙස කටයුතු කළ ආකාරය උදාන පාලියෙන් ප්‍රතියමාන වේ. උදාන පාලිය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම ධර්ම ග්‍රන්ථයක් ලෙස හඳුනාගත හැකි ය. එහෙත් ධර්මය විවරණයට සාපේක්ෂ ව ම උදාන පාලියේ සමකාලීන සමාජ ආගමික දේශපාලනික හා ආර්ථික තොරතුරු ඉතාමත් මැනවින් නිරූපණය වන බව පෙන්වා දීම යුක්ති යුක්ත ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

දේවරක්ඛිත බිහල්පොල (සංසෝ)(2011) **උදානට්ඨකථා.** කොළඹ:සෝමවතී හේවාවිතාරණ භාරය.

වජිරඤාණ, පරවාහැර. (සංස්)(2005) **ඛුද්දක නිකාය ප්‍රථම භාගය උදාන පාළි.** දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සරත්චන්ද්‍ර, විජිතනන්ද. (පරි)(2008) **උදානට්ඨකථා**, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සුධර්මාලංකාර, වල්පිට. (2011) **ඛුද්දක නිකාය විමංසා.** මාතර: කර්තෘ ප්‍රකාශන.